**තනතුරු - ඇබෑර්තු**

**උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය**

**උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් පාසල්වල පුරප්පාඩුව පවත්නා විදුහල්පති තනතුරු සඳහා ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් පත්කිරීම.**

උතුරු මැද පළාතේ පළාත් පාසල්වල විදුහල්පති තනතුර පුරප්පාඩුව පවතින 1AB, 1C, Type 2 හා Type3 යන වර්ගීකරණයට අයත් පාසල් 418 ක් සඳහා උතුරු මැද පළාත් පාසල්වල සේවයේ නියුතු ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් වෙතින් 2025.03.05 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සුදුසුකම්:

1.1. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.

1.2. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර 5ක් තුළ වාර්ෂික වැටුප් වර්ධක සියල්ල උපයාගෙන සක්‍රීය හා සතුටුදායක හෝ ඉන් ඉහළ කාර්ය සාධන මට්ටමක් අත්කර ගෙන තිබිය යුතුය.

1.3. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

02. අයදුම්පත් ඉදිරිපත් කිරීම:

2.1. මේ සමඟ අමුණා ඇති (ඇමුණුම 01) ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පතක් 12"x8" ප්‍රමාණයේ කඩදාසියක (A4) සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. (ආදර්ශ අයදුම්පත්‍රය www.cm.nc.gov.lk හා www.edncp.lk යන වෙබ් අඩවි වලින් බාගත කරගත හැකි ය) එම සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟ ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකයේ හා සුදුසුකම් සනාථ කෙරෙන සියලු සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.

2.2. නිවැරදිව හා විධිමත්ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් "ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, 5 වන මහල, උතුරු මැද පළාත, අනුරාධපුර" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "උතුරු මැද පළාතේ විදුහල්පති තනතුර සඳහා අයදුම්පත් කැඳවීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

2.3. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හෝ අපැහැදිලි අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ අස්ථානගතවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් භාර ගනු නොලැබේ.

03. තෝරා ගැනීමේ ක්‍රමය:

උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඉහළම ලකුණු ලැබුවන්ගේ ලකුණු වල කුසලතා අනුපිළිවෙල හා පවත්නා පුරප්පාඩු මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

[පවතින පුරප්පාඩු ලැයිස්තුව (ඇමුණුම 03) හා අනුමත ලකුණු පටිපාටිය (ඇමුණුම 02) www.cm.nc.gov.lk හා www.edncp.lk යන වෙබ් අඩවිවල පළ කර ඇත.]

Scanned with CamScanner

04. විශේෂ කරුණු

4.1. අයදුම්පත් කැඳවන අවසන් දිනට (2025.03.05 වන දිනට) අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

4.2. මෙම නිවේදනය සමඟ ඉදිරිපත් කර ඇති අමුණුම 03 හි සඳහන් ලැයිස්තුවේ ඇති <u>සියලු පාසල් සඳහා ඔබේ මනාපය අනිවාර්යයෙන්ම සලකුණු කළ යුතුය</u>. (1 සිට 418 දක්වාම) ඔබ විසින් නිසි පරිදි මනාපය පළ කර නොමැතිතේ නම් ඔබ විසින් ලබාගත් ලකුණු පදනම්ව පත් කරනු පාසල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ඇත.

4.3. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත්වීමට කිසියම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බවට අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය අතරතුර හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

4.4. සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා ගැනීමේ ප්‍රමුඛතාවය හා මනාප ප්‍රකාශ පදනම් කර ගනිමින් පුරප්පාඩු පවත්නා පාසල් වෙත පත්කිරීම සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, ප්‍රතිඵල නිකුත් කිරීම, පත්කිරීම් සිදු කිරීම හා මෙහි විධිවිධාන සලසා නොමැති අවස්ථානුකූලව එළඹෙන කරුණු පිළිබඳ තීරණ ගැනීම සම්බන්ධයෙන් උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

කේ.එම්.එච්.එස්.කේ.ජයලත්
ලේකම්
ප්‍රධාන අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

කේ.එම්.එච්.එස්.කේ. ජයලත්
ලේකම්
ප්‍රධාන අමාත්‍යාංශය
උතුරු මැද පලාත

2025 පෙබරවාරි මස 14 වැනි දින,
උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේදී ය.

Scanned with CamScanner